# ශ්‍රී ලංකාවේ රාජත්වයේ ප්‍රභවය හා විකාශනය

ආර්. එම්. එන්. සුභාෂණී
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ragamunige@gmail.com

**සංක්ෂේපය**

ලාංකීය රාජ්‍යය පාලනය තුළ අතීතයේ සිට වර්තමානය දක්වා පැවති ප්‍රධානතම තනතුර වූයේ "රජ" තනතුරයි. නැතහොත් සියළු පාලන සංස්ථාවල ප්‍රධානියා රජු ලෙස හඳුන්වාදිය හැකි ය. රාජ, මිහිපති, භූපුර, භූපති ආදී පර්යාය නාමයන් රජු හැඳින්වීම සඳහා භාවිතා කරයි. මෙසේ රටේ ප්‍රධානියා වූ රජුගේ රාජත්වය ලාංකීය ඉතිහාසය තුළ කෙසේ ආරම්භ වූයේ ද යන්න පිළිබඳ විමසීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයට අනුව පැහැදිලි වන්නේ විජයගේ පැමිණීමෙන් පසු රාජත්වය මෙරට ස්ථාපිත වූ බවය.

විජය මෙරට පාලන බලය ලබාගෙන රාජත්වය ස්ථාපිත කිරීම සඳහා ක්ෂත්‍රිය වංශික කුමාරිකාවක් මධුරාපුරයෙන් ගෙන්වාගෙන අභිෂේකය සිදු කිරීමෙන් අනතුරුව රාජත්වය මෙරට තුළ ස්ථාපිත විය.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ රාජත්වය ස්ථාපනය වීම හා එය විකාශනය වූයේ කෙසේ ද යන්න පිළිබඳ ව විමසීම වන අතර ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් භාවිතා කරනු ලැබී ය. ඒ අනුව රාජ්‍යත්වය ස්ථාපිත වීමට රාජාභිෂේකය ප්‍රධාන වන අතර පසුව එය විකාශනය වීමේ දී සහෝදරයාගෙන් සහෝදරයාට මෙන් ම පියාගෙන් පුතාට රජකම හිමි වූ බව මේ පර්යේෂණයේ දී අවබෝධ විය.

**ප්‍රමුඛ පද :- රාජත්වය, රජු, විකාශනය**